# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2000/48 – 2017 ජනවාරි 04 වැනි බදදා – 2017.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/04/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. සී. එල්. කේ. වික්‍රමරත්න මයා, කෝන්ගහවත්ත, කුඩාගම, දොඹේමඩ, රඹුක්කන.

සහ

*අනෙක් පාර්ශ්වයක් වශයෙන්,*

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 1වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, තැ. පෙ. 807, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 03හි, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/04/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වය වශයෙන්,*

එස්. සී. එල්. කේ. වික්‍රමරත්න මයා, කෝන්ගහවත්ත, කුඩාගම, දොඹේමඩ, රඹුක්කන.

සහ

*අනෙක් පාර්ශ්වයක් වශයෙන්,*

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 1වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, තැ. පෙ. 807, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ II වන ශ්‍රේණියේ කළමනාකරුවෙකු ලෙස වැඩබලන පදනම යටතේ සේවය කරන එස්. සී. එල්. කේ. වික්‍රමරත්න මහතාට ලබා දී ඇති පත්වීම 2009.08.01 දින සිට ස්ථිර පදනම මත ක්‍රියාත්මක වන පරිදි පසුදාතම් නොකිරීම යුක්ති සහගත ද යන්න හා එසේ නොවේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 536

---

මගේ අංකය: IR/COM/01/B/2014/181.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා වැවිලි හා වෙළඳ සේවා සංගමය, අංක 34/3 , පැස්කුවල් මාවත, මතුගම.( ජී. ඩී. ඥාණසෞන්දරී මිය වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී, අංක 10, ඥානාර්ථ ප්‍රදීප මාවත, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, අංක 213, එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/B/2014/181.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා වැවිලි හා වෙළඳ සේවා සංගමය, අංක 34/3 , පැස්කුවල් මාවත, මතුගම.( ජී. ඩී. ඥාණසෞන්දරී මිය වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී, අංක 10, ඥානාර්ථ ප්‍රදීප මාවත, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''අගලවත්ත ප්ලාන්ටේෂනස් පී. එල්. සී. ආයතනයට අයත් අගලවත්ත, පිඹුරවත්තේ සේවය කළ ජී. ඩී. ඥාණසෞන්දරී නමැති සේවිකාව 2014 ජනවාරි මස 20 වැනි දින රබර් කිරි සොරකමක් පිළිබඳව වරදකරු කර 2014 අප්‍රේල් මස 08 වැනි දින සිට සේවයෙන් පහ කිරීම අසාධාරණ හා අයුක්ති සහගත වන්නේද ? එසේ වන්නේ නම් ඇයට ලැබිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 537

---

මගේ අංකය: IR/COM/02/P/2015/187.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්*

ඩබ්. එල්. ඒ. ද සිල්වා මහතා, අංක 667/32-ඒ, 5 වන පටුමග, යටිහේන, වඩුවේගම, මල්වාන.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, නො. 213, එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/P/2015/187.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්*

ඩබ්. එල්. ඒ. ද සිල්වා මහතා, අංක 667/32-ඒ, 5 වන පටුමග, යටිහේන, වඩුවේගම, මල්වාන.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්*

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කළ ඩබ්. එල්. ඒ. ද සිල්වා මහතා 1999.04.01 දින සිට 2003.10.01 දින දක්වා සපුගස්කන්ද පුනරුත්ථාපන හා නඩත්තු ව්‍යාපෘතියට මුද හැර තිබූ කාලසීමාවද, ඔහු ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කළ සක්‍රීය සේවා කාලයක් සේ සළකා ඔහුට අදළ නියමිත වැටුප් තලය, වැටුප, විශ්‍රාම වැටුප, පාරිතෝෂික දීමනා ඇතුළු සියලු දීමනා ගණනය කර ලබා දෙන ලෙස ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේද යන්න සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 538

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.